| | |
|---|---|
| | **South Asian International Institute of Higher Education** |
| | **Diploma in Early Childhood Care and Development** |
| | **Assignment list for Part I** (Theory150 hrs.)– **(From Group 125 up to Group 132)** |
| | Published on – February 2020 |
| 1 | මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳව කටයුතු කරන අන්තර්ජාතික සංවිධාන පිළිබඳව විග්‍රහ කර එම සංවිධාන ශ්‍රී ලංකාව ඇතුලු ලෝකයේ විවිධ රටවල මුල් ළමාවිය හා රැකවරණය සඳහා දායක වන ආකාරය පිළිබඳව වාර්තාවක් සකස් කරන්න.<br>(විෂය – අධ්‍යාපන විකාශනය – ලකුණු 30 – අධ්‍යයන පැය – 40) |
| 2 | එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) 2019 වසරේ පියවරුන්ගේ දිනයේදී ශ්‍රී ලංකාව සම්බන්ධව සිය නිල ලාංඡනයෙන් මවගේ රූපය ඉවත් කරන ලද්දේ ද පවුලට හිතකර ක්‍රියාකාරකම් වැඩිකරලීමේ අරමුණ ඇතිවයි. ශ්‍රී ලාංකීය මුල් ළමාවිය දරුවන් මුහුණ දෙන සෞඛ්‍ය, පෝෂණ, හිංසන, අපහරණ, අපයෝජන ද පැහැදිලි කර ඊට බලපාන හේතු අවම කර ගැනීම සඳහා සහ ළමයාගේ සුරක්ෂිත බව හා මනා වර්ධනය සඳහා දෙමාපියන්ට, සමාජයට හා රජයට ගත හැකි ක්‍රියාමාර්ග පෙන්වා දෙමින් වාර්තාවක් සකස් කරන්න.<br>(විෂය - ළමා රැකවරණය – ලකුණු 30 කි – අධ්‍යයන පැය – 35) |
| 3 | “අභිනවයෙන් පත් වූ නව ජනාධිපතිවරයාගේ එක් අරමුණක් වන්නේ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය දරුවන්ට පාසලෙන් ලබා දිය යුතු දැනුම ලබා දෙන තවත් එක් තරගකාරී ස්ථානයක් බවට පත් කිරීම නොවේ’’. මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන දරුවන්ට දයාව, කරුණාව, මෛත්‍රිය භුක්ති විදිය හැකි පූර්ව අධ්‍යාපන මධ්‍යස්ථානයක් කිරීම සඳහා ඔබගේ යෝජනා ඉදිරිපත් කරමින් එම යෝජනා දියත් කිරීම සඳහා මුල් ළමාවිය සංවර්ධන අධ්‍යාපන (පෙර පාසල්) විෂයමාලාව හා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම කෙසේ වෙනස් විය යුතුදැයි පැහැදිලි කරමින් වාර්තාවක් සකස් කරන්න. ජාත්‍යන්තරයට ගැළපෙන මුල් ළමාවිය සංවර්ධන ගුරුවරියක් තුළ තිබිය යුතු නිර්මාණශීලීතවය, ගුරු පෞරුෂය හා අත්‍යාවශය නිපුණතා ද එම වාර්තාවට ගොනු කරන්න.<br>(විෂය – ගුරු භූමිකාව - ලකුණු 30 – අධ්‍යයන පැය – 35) |
| 4 | ඉගෙනුම් ක්‍රමවේද විෂය භාර කථිකාචාර්යවරයා සිසුන් කණ්ඩායම් කර දෙන ලද තේමා සඳහා සති සැලසුම් 02 ක් සකස් කර එම සති සැලසුම් 02 සඳහා දෛනික සැලසුම් 10 ක් සකස් කර ඉන් කැමති ක්‍රියාකාරකම් 10 ක් සඳහා පාඩම් සැලසුම් 10 ක් සකස් කරන්න. සිසුන් උපරිමය පස් දෙනා බැගින් වන කණ්ඩායම් වශයෙන් එක්ව කණ්ඩායම් ක්‍රියාකාරකමක් වශයෙන් සිදුකර google drive හි තැන්පත් කළ යුතුය. (විභාගයේදී පෙන්වීම සඳහා මුද්‍රිත පිටපත් වෙන වෙනම සිසුන් ළග තබා ගත යුතුය.)<br>(පාඩම් සැලසුම් සකස් කිරීමේදි පියවර ක්‍රමයට 5 ක් හා වගු ගත ක්‍රමයට 5 ක් සකස් කරන්න.)<br>(විෂය – ඉගෙනුම් ක්‍රමවේද – ලකුණු 30 – අධ්‍යයන පැය – 40) (අවසාන දිනය- ඉගෙනුම් ක්‍රම වේද වල පාඩම් සැලසුම් ඉගැන්වූ දින සිට මාස 02 ක් ඇතුලත) |
| | පරිගණකගත කර හෝ පැහැදිලි අත් අකුරින් සකස් කරන්න. පැවරුම් ප්‍රමිතිය A4 size, single side, 12 pts, 1.5 line space. 1” margin, Hard binding<br>. |
| | 04 වන පැවරුම සඳහන් කර ඇති දින ද සෙසු පැවරුම් පළමු වාර අවසාන විභාගය පැවැත්වෙන දින ද බාරදිය යුතු ය |

| | |
|---|---|
| | **Assignment list for Part I (Practical -150 Hrs) – (From Group 125 up to Group 132)** |
| | Published on – February 2020 |
| 1 | මුල් ළමාවිය දරුවන්ගේ ප්‍රජානන කුසලතා සංවර්ධනයට අදාල අනු අංශ හා සුවිශේෂී අංශ සංවර්ධ නයට සුදුසු ක්‍රියාකාරකම් පොතක් සකස් කරන්න.<br>(විෂය – විෂයමාලා හා කියාකාරකම් – ලකුණු 10 – අධ්‍යයන පැය – 20) |
| 2 | මුල් ළමාවිය දරුවන්ගේ භාෂාව හා මුල් කාලීන සාක්ෂරතාව සංවර්ධනයට අදාල අනු අංශ හා සුවිශේෂී අංශ සංවර්ධනයට සුදුසු ක්‍රියාකාරකම් පොතක් සකස් කරන්න.<br>(විෂය – විෂයමාලා හා කියාකාරකම් – ලකුණු 10 – අධ්‍යයන පැය – 20) |
| 3 | මුල් ළමාවිය දරුවන්ගේ පෞද්ගලික සුරක්ෂිතතාව හා යහජීවන පුරුදු වලට අදාල සුවිශේෂී අංශ ස ංවර්ධනය සඳහා සුදුසු ක්‍රියාකාරකම් පොතක් සකස් කරන්න.<br>(විෂය – විෂයමාලා හා කියාකාරකම් – ලකුණු 10 – අධ්‍යයන පැය – 20) |
| 4 | මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක දරුවන්ට උචිත සරළ කවි ගීත, ස්වතන්ත්‍ර කවි ගීත අඩංගු නිර්මාණ පොතක් /පොත් හා දරුවන්ගේ ගායන, වාදන, හැකියාව දියුණු කිරීමට උචිත ආදේශ සංගීත වාද්‍ය භාණ්ඩ එකතුවක් සකසන්න.<br>(ආදේශ වාද්‍ය භාණ්ඩ ඡායාරූප හෝ චිත්‍ර ආකාරයෙන් ඇඳ එය සකස් කර ගැනීමට අවශ්‍ය අමු ද්‍රව්‍ය හා සකස් කරන ආකාරය සටහන් කර තිබිම ප්‍රමාණවත් වේ.)<br>(විෂය – විෂයමාලා හා කියාකාරකම් – ලකුණු 20 – අධ්‍යයන පැය – 40) |
| 5 | මුල් ළමාවිය දරුවාගේ සියුම් චාලක කුසලතා සංවර්ධනයට අදාල චිත්‍ර, හසුරු කුසලතා, ඇඹීම්, ආකෘති සඳහා නිර්මාණ පොත් වෙන වෙනම සකස් කරන්න.<br>(ඇඹීම් ආකෘති වැනි නිර්මාණ කිරීමේදී ඔබගේ නිර්මාණ වල ඡායාරූප හෝ චිත්‍ර නිර්මාණ පොතෙහි සටහන් කිරීම ප්‍රමාණවත්ය. එහිදී එක් එක් නිර්මාණය සඳහා යොදා ගත් අමු ද්‍රව්‍ය හා නිර්මාණය සිදු කරන අකාරය සටහන් කර තබන්න.)<br>(විෂය – විෂයමාලා හා කියාකාරකම් – ලකුණු 30 – අධ්‍යයන පැය – 50) |
| | මෙම පැවරුම් පළමු වාරය තුළ සම්පූර්ණ කර විෂය භාර ග=රුවරුන් ලවා පැවරුම් පොත් ඇගයීම් කරවා ඔවුනගේ අත්සන සටහන් කරවා ගන්න. පැවරුම් ආයතනයට භාර දිය යුත්තේ දෙවෙනි වා ර අවසාන විභාගයෙන් පසුව පැවැත්වෙන ප්‍රාෙයා්ගික ගුරු පුහුණු පරීක්ෂණය දිනයේ දීය. |

| | |
|---|---|
| | **South Asian International Institute of Higher Education** |
| | **Diploma in Early Childhood Care and Development** |
| | **Assignment list for Part II (Theory 150 Hrs)– (From Group 125 up to Group 132)** |
| | Published on – February 2020 |
| 1 | මුල් ළමාවිය දරුවන්ගේ සමස්ථ සංවර්ධනට අදාල වන ප්‍රමිතීන්ට දරුවන් ළගා වී ඇත්දැයි බැලීම සඳහා ළමා තක්සේරු ඇගයීම් පත්‍රිකාව යොදාගෙන අවම වශයෙන් දරුවන් 10 දෙනෙකු ඇගයීම් කර තක්සේරු වාර්ථාවක් සකස් කරන්න.<br>තක්සේරු පත්‍රිකාව http://saiihe.com/publications/learning-materials/ හි දක්වා ඇත.<br>(විෂය – තක්සේරුව හා ඇගයීම – ලකුණු 30 – අධ්‍යයන පැය – 25) |
| 2 | නව රජයේ අරමුණ වන්නේ ''පාසලේ දී ලබාදිය යුතු දැනුම ලබාදෙන තවත් එක් තරගකාරී ස්ථානයක් බවට මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පත්කිරීම වෙනුවට දරුවන්ට දයාව, කරුණාව, මෛත්‍රිය භුක්ති විදිය හැකි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් ක්‍රියාත්මක ස්ථානයක් බවට මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පත්කිරිමයි. ලෝකයේ විවිධ රට වල මුල් ළමාවිය අධ්‍යාපනය ක්‍රියාත්මක වන ආකාරය විශ්ලේෂණය කරමින් උක්ත අරමුණු ඉටු කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ මුල් ළමාවිය සංවර්ධන ක්ෂේත්‍රයේ සිදුවිය යුතු වෙනස්කම් ගොනු කරමින් වාර්තාවක් සකස් කරන්න.<br>(විෂය – මධ්‍යස්ථාන කළමනාකරණය – ලකුණු 30 – අධ්‍යයන පැය – 25) |
| 3 | මුල් ළමාවිය ජාතික ප්‍රමිතියට අනුව දරුවාගේ සමස්ථ සංවර්ධනය සඳහා අදාල වන සංවර්ධන අංශ, අනු අංශ හා සුවිශේෂී අංශ වලින් එක් අංශයක් තෝරාගෙන පර්යේෂණාත්මකව අධ්‍යයනය කළ හැකි ගැටළුවක් හදුනාගන්න. පර්යේෂණ නිබන්ධනයේ පළමු පරිච්ඡේදය සම්පූර්ණ කරන්න.<br>(විෂය – පර්යේෂන නිබන්ධන – ලකුණු 15 – අධ්‍යයන පැය – 20) |
| 4 | පර්යේෂණ නිබන්ධනය සඳහා තෝරාගත් ගැටළුවට අදාල විවිධ විද්වතුන්ගේ මත හා අදාල ශාස්ත්‍රීය කරුණු අඩංගු කර පර්යේෂණ නිබන්ධනයේ දෙවන පරිච්ඡේදය – සාහිත්‍ය විමර්ශනය සම්පූර්ණ කරන්න.<br>(විෂය – පර්යේෂණ නිබන්ධන – ලකුණු 25 – අධ්‍යයන පැය – 20) |
| 5 | පර්යේෂණ නිබන්ධනය සඳහා තෝරාගත් ගැටළුවට අදාල සැලසුම් කළ ක්‍රමවේද හා මැදිහත්වීම් පැහැදිලි කරමින් තෙවන පරිච්ඡේදය සම්පූර්ණ කරන්න.<br>(විෂය – පර්යේෂණ නිබන්ධන – ලකුණු 15 – අධ්‍යයන පැය – 20) |
| 6 | පර්යේෂණ නිබන්ධනය සඳහා තෝරාගත් ගැටළුවට අදාලව දත්ත විශ්ලේෂණය හා ඒ පිළිබඳ ප්‍රත්‍යාවේශන පැහැදිලි කරමින් පර්යේෂණ නිබන්ධනයේ හතරවන පරිච්ඡේදය සම්පූර්ණ කරන්න.<br>(විෂය – පර්යේෂණ නිබන්ධන – ලකුණු 25 – අධ්‍යයන පැය – 20) |
| 7 | පර්යේෂණ නිබන්ධනය සඳහා තෝරාගත් ගැටළුවට අදාලව සිදුකළ අධ්‍යයන ඔස්සේ ඔබගේ අදහස් නිගමන හා යෝජනා අඩංගු කර පර්යේෂණ නිබන්ධනයේ පස්වන පරිච්ඡේදය සම්පූර්ණ කරන්න. (විෂය – පර්යේෂණ නිබන්ධන – ලකුණු 15 – අධ්‍යයන පැය – 20) |
| | පරිගණකගත කර හෝ පැහැදිලි අත් අකුරින් සකස් කරන්න. පැවරුම් ප්‍රමිතිය A4 size, single side, 12 pts, 1.5 line space. 1" margin, Hard binding |
| | දෙවන වාර අවසාන විභාගය පැවැත්වෙන දින බාරදිය යුතු ය. |

| | Assignment list for Part II (Practical 150Hrs) – (From Group 125 up to Group 132) |
|---|---|
| | Published on – February 2020 |
| 1 | මුල් ළමාවිය දරුවන්ගේ දල වාලක කුසලතා සංවර්ධනය සඳහා සුදුසු ක්‍රියාකාරකම් පොතක් සකස් කරන්න. (විෂය – විෂයමාලා හා ක්‍රියාකාරකම් – ලකුණු 10 – අධ්‍යයන පැය – 15) |
| 2 | www.ulpatha.com වෙබ් අඩවියේ ECCD යටතේ curriculum වල Annual Plan for the ECCD Centers යටතේ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන වල සති තේමා දක්වා ඇත. ඉන් සති 03 ක් තෝරා තෝරා ගෙන ගෙන එම සති වල දින සඳහා දෛනික සැලසුම් 10 ක් සකස් කරන්න. (විෂය – විෂයමාලා හා ක්‍රියාකාරකම් – ලකුණු 30 – අධ්‍යයන පැය – 35) |
| 3 | උක්ත සකස් කළ දෛනික සැලසුම් වලින් තෝරා ගත් ක්‍රියාකාරකම් සඳහා පාඩම් සැලසුම් 20 ක් සකස් කරන්න. (විෂය – ප්‍රායෝගික ගුරු පුහුණුව – ලකුණු 40 – අධ්‍යයන පැය – 50) |
| 4 | මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක දරුවන්ගේ සමස්ත සංවර්ධනය සඳහා ක්‍රියාකාරකම් සිදුකිරීම සඳහා උචිත ඉගෙනුම් ආධාරක ගොණුවක් සකස් කරන්න. (විෂය – ප්‍රායෝගික ගුරු පුහුණුව – ලකුණු 20 – අධ්‍යයන පැය – 50) |
| | ප්‍රායෝගික පුහුණුව ලැබූ පෙර පාසලේ අධීක්ෂණ ගුරුතුමිය ලවා සියළුම නිර්මාණ පොත් හා පාඩම් සැලසුම් නිර්දේශ කරවා පෙර පාසලේ මුද්‍රාව සෑම පොතකම සටහන් කරවා තිබිය යුතුය. |
| | සති සැලසුම්, දෛනික සැලසුම්, පාඩම් සැලසුම් ප්‍රායෝගික ගුරු පුහුණු පරීක්ෂණය දින රැගෙන ආ යුතු ය. සෙසු සියළුම නිර්මාණ හා ක්‍රියාකාරකම් පොත් මුල් ළමාවිය විෂයමාලාව හා ක්‍රියාකාර කම් පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය පැවැත්වෙන දින ඉදිරිපත් කළ යුතු ය. |

## අවසාන විභාගය – පර්යේෂණ නිබන්ධනය

ගුරු සිසු සිසුවියන් හා කථිකාචාර්යවරු ඉදිරියේ ඔබගේ පර්යේෂණ නිබන්ධනයේ අන්තර්ගතය පිළිබඳව Power point presentation එකක් අනිවාර්යයෙන් ඉදිරිපත් කළ යුතුය. එය ඉදිරිපත් කිරීමට දින තුනකට පෙර presentation එක saiihegm@gmail.com ලිපිනයට විද්‍යුත් තැපෑලෙන් එවිය යුතුය. සෑම සිසු සිසුවියකටම විනාඩි 25 ක කාලයක් ඉදිරිපත් කිරීම සඳහා ලබා දෙනු ඇත.

පර්යේෂණ නිබන්ධනය සඳහා අධීක්ෂණ කථිකාචාර්යවරු

| මධ්‍යස්ථානය | අධීක්ෂණ කථිකාචාර්යවරු |
|---|---|
| නුගේගොඩ | ජානක කමල්ගොඩ මහතා/ ගිම්හානි ද සිල්වා |
| නුවර | කුමුදුනී අබේරුවන් මහත්මිය / නිම්නිකා ලියනගේ මෙනවිය/ටී.එල්. යූ. තරංගනී මහත්මිය |
| ගාල්ල | සරත් පියසේකර මහතා/ කුමාර කරුණාරත්න මහතා |
| රත්නපුර | සරත් පියසේකර මහතා / කුමාර කරුණාරත්න මහතා |
| කුරුණෑගල | සුනන්ද වර්ණකුළසූරිය මහතා |
| බන්ඩාරවෙල | විජ්ලා නෙල්ලිහෙළ මහත්මිය |
| අනුරාධපුර | ජානකී කළුආරච්චි මහත්මිය / සුනන්ද වර්ණකුළසූරිය මහතා |
| මීගමුව | ජානක කමල්ගොඩ මහතා /ලක්ෂිකා අලුත්ගමගේ මහත්මිය |

✸අවසාන විභාගය - ප්‍රායෝගික ගුරු පුහුණුව හා විෂයමාලාව හා ක්‍රියාකාරකම් ප්‍රායෝගික පරීක්ෂණය පිළිබඳ විස්තර http://saiihe.com/assignments/ යටතේ දක්වා ඇත.

දෙවන වාරය අවසාන විභාගය පවත්වා මාස 02 ක් ඇතුළත ඉහත දැක්වූ සියලු ප්‍රයෝගික පරීක්ෂණ පවත්වා අවසන් කරයි..

# අවසාන විභාගය ප්‍රායෝගික ගුරු පුහුණුව

දකුණු ආසියා අන්තර්ජාතික උසස් අධ්‍යාපන ආයතනය මෙහෙය වූ මුල් ළමාවිය රැකවරණය හා  සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ අවසාන විභාගය දෙවන කොටසට නියමිත ප්‍රායෝගික ගුරු පුහුණුවට අදාල විස්තර පහත දැක් වේ.

ප්‍රායෝගික ගුරු පුහුණු පරික්ෂණය ………… දින ………………………………දි පෙරවරු 8.00 ට පැවැත්වේ. මෙම පරීක්ෂණය සඳහා පහත සඳහන් දෑ රැගෙන ආ යුතුය.

ඔ කැමති මාතෘකාවක් ඔස්සේ පෙර පාසල් දරුවන්ට විනාඩි 20 උපරිමයකට යටත්ව පාඩමක් /  ක්‍රියාකාරකමක් ඉදිරිපත් කළ යුතුය. එහිදි ළදරු පංතිය (Baby Class)   හෝ ඉහළ පංතිය (Upper  Class)   යන පංතියට ඉගැන්වීමට සුදානම් විය යුතුය.

මෙහිදි පහත සඳහන් දෑ රැගෙන ආ යුතුය.

1. පිටපත් දෙකකින් යුතුව(Baby Class) එක සඳහා සකස් කළ පාඩම් සැලැස්ම

2. පිටපත් දෙකකින් යුතුව (Upper  Class) එක සඳහා සකස් කළ පාඩම් සැලැස්ම

3. පාඩම ඉදිරිපත් කිරිම සඳහා අවශ්‍ය ඉගෙනුම් ආධාරක (ළමයින් 25 සඳහා)

4. අවම වශයෙන් මාස තුනක සේවා සහතිකය හා එහි ඡායා පිටපතක් (පෙර පාසලේ ලිපි ශිර්ෂය හෝ රබර් මුද්‍රාව තිබිය යුතුය.)

5. පෙර පාසලේ ප්‍රායෝගික පුහුණු කාලය තුළ දෛනික කටයුතු සටහන් කල ශිෂ්‍ය වාර්තා පොත

6. පාඩම් සැලසුම් 36 සහිත පාඩම් සැලසුම් පොත.

7. පෙර පාසලේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ නිරත වූ බව සනාථ කිරීම. (ඡායාරූප, ඉගෙනුම් ආධාරක, පිළිගත හැකි වෙනත් සාක්ෂි)

8. ආයතනයේ බාහිර ක්‍රියාකාරකම් සහ අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය සඳහා සමාජීය දායකත්වය (ඡායාරූප, සහතිකපත්‍ර)

# අවසාන විභාගය – විෂයමාලාව හා ක්‍රියාකාරකම් ප්‍රායෝගික පරීක්ෂණය

දකුණු ආසියා අන්තර්ජාතික උසස් අධ්‍යාපන ආයතනය මෙහෙය වූ මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ මුල් ළමාවිය සංවර්ධන විෂයමාලාව හා ක්‍රියාකාරකම් විෂයට අදාල ඇගයීම් ක්‍රියාවලියේ විස්තර පහත දැක් වේ.

මුල් ළමාවිය සංවර්ධන විෂයමාලාව හා ක්‍රියාකාරකම් විෂයට අදාල ප්‍රායෝගික පරික්ෂණය …………….. දින ……………………………දි පෙරවරු 8.30 සිට පස්වරු 4.00 දක්වා පැවැත්වේ. මෙහිදි නිර්මාණ ක්‍රියාකාරකම් සකස් කිරීම හා ප්‍රායෝගික ඉදිරිපත් කිරීම් යන අංශ යටතේ ප්‍රායෝගික පරික්ෂණයක් පැවැත්වෙනු ඇත.

## 01. නිර්මාණ ක්‍රියාකාරකම්

1. මනෝ චාලක ක්‍රියාකාරකම් වලට අදාල නිර්මාණ –  ( ඇට වර්ග, අපතේ යන දෑ, (උදා – තේ කූඩු) , පරිසර ආශ්‍රිත ශාක ද්‍රව්‍ය උදා- වියළි මල්, ශාක පත්‍ර, ශාක මුල් ආදි අවශ්‍ය අමු ද්‍රව්‍ය )

2. චිත්‍ර වලට අදාල නිර්මාණ – ( දිය සායම්, පැස්ටල්, අවශ්‍ය කොළ හා අනෙකුත් අමු ද්‍රව්‍ය )

3. ඇඹීමට අදාල නිර්මාණ –  ( මැටි, පාන්පිටි, මිශ්‍රන කඩදාසි, පල්ප ආදි අමු ද්‍රව්‍ය )

4. ආකෘති නිර්මාණ  – ( ගිනි පෙට්ටි, හිස් පෙට්ටි ආදි අමු ද්‍රව්‍ය )

5. ආදේශ සංගීත භාණ්ඩ නිර්මාණය කිරීම – ( අවශ්‍ය අමු ද්‍රව්‍ය රැගෙන ආ යුතුය )

ප්‍රායෝගික පරික්ෂණයේදී දෙනු ලබන මාතෘකාවලට අදාලව නිර්මාණශීලි නිදහස් නිර්මාණ කිරීමට අවස්ථාව ලබා දෙන හෙයින් අවශ්‍ය අමු ද්‍රව්‍ය තම අභිමතය පරිදි සූදානම් කර ගත හැක.

පාඨමාලා කාලය තුළ ඔබ විසින් සකස් කර ඇති මුල් ළමාවිය සංවර්ධන විෂයමාලාව හා ක්‍රියාකාරකම් විෂයට අදාල පැවරුම් ලේඛන වල සඳහන් පොත් (නිර්මාණ පොත්, චිත්‍ර පොත, සෞන්දර්ය කුසලතා සංවර්ධනය සඳහා ගීත පොත්) සහ ඉගෙනුම් ආධාරක සියල්ල රැගෙන ආ යුතුය. පරික්ෂකවරයා විසින් එම පොත් පරික්ෂාවට ලක් කොට ලකුණු ලබා දෙනු ඇත.

## 02. ප්‍රායෝගික ඉදිරිපත් කිරීම්

1. පංති කාමර ඉදිරිපත් කිරිම (ගායන, රංගන) කුසලතාවලින් සමන්විත විය යුතුය.

2. සෞන්දර්ය ඉදිරිපත් කිරීම් හා සංවර්ධන අංශ වලට අදාළව ලබා දෙන මාතෘකා ඔස්සේ ඉදිරිපත් කිරීම් සිදු කළ යුතුය.

……………………………………………………………………………………………………………………